**අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2015**

----------------------------------------------------

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනයට අදාළ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 47(2) වගන්තිය සහ 2014 ඔක්තෝබර් මස 03 දිනැති අංක 1882/51 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ 17(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 49(1) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (**ISSAI 1000-–1810)** අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 පිහිටුවීම

-----------

2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 5(ඉ) වගන්තිය සමඟ කියවිය යුතු 20 වන වගන්තියේ (1) උපවගන්තිය යටතේ 2014 ඔක්තෝබර් 1 දින සිට බලාත්මක වන පරිදි වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් සකස්කරන ලද 2014 අංක 1 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලිය යටතේ එහි අනුබද්ධ ආයතනයක් ලෙස අනුරාධපුර

විශ්වවිද්‍යාල විද්‍යායතනය පිහිටුවා තිබුණි. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් අනුමත කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 5, 6 හා 7 මට්ටමේ සහ ඒ සමාන මට්ටම්වල තාක්ෂණවේදී පාඨමාලා මෙහෙයවීම ප්‍රධාන අරමුණ වේ.

2. මූල්‍ය ප්‍රකාශන

-----------------

2.1 මතය

-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2. විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 4කදී පවත්වා තිබුණු කළමනාකරණ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගී වූ සාමාජිකයන් වෙත ගෙවා තිබූ රු.48,000ක දීමනා සනාථ කර ගැනීම සඳහා පැමිණීමේ ලේඛන විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

-----------------------------------------------------------------------------

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 756 | විද්‍යායතනය සතු ඉන්වෙන්ට්‍රි භාණ්ඩ හා ගබඩා ද්‍රව්‍ය පිළිබඳ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ආ) භාණ්ඩාගාර චක්‍රලේඛ | |
| (i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.103,880,263 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය අවසානයට රු.7,689,846 ක් වූ පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) 2001 පෙබරවාරි 26 දිනැති අංක 393(I) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රැස්වීම් පැවැත්වීම සඳහා හෝටල් භාවිතා නොකළ යුතු බව දක්වා තිබියදී ඊට අනුකූල නොවන පරිදි සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේ පවත්වා තිබූ කළමනාකරණ මණ්ඩල රැස්වීම අනුරාධපුර පුද්ගලික හෝටලයක පවත්වා ඒ සඳහා රු.20,000 ක් ශාලා ගාස්තු ලෙස ගෙවා තිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය
-----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.148,756 ක ඌනතාවයක් විය. සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය ගැලපීමෙන් පසු ආයතනයේ දායකත්වය රු.27,643,516 ක අතිරික්තයක් විය.

4. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

4.1 කාර්යසාධනය
-------------------

2014 අංක 01 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලියට අනුව ජාතික වෘත්තීය සුදුසුකම් 5, 6 හා 7 මට්ටමේ පාඨමාලා සහ ඒ හා සමාන මට්ටම්වල වෙනත් තාක්ෂණවේදී පාඨමාලා මෙහෙයවීම විද්‍යායතනයේ අරමුණු ලෙස දක්වා තිබුණි. කෙසේ වුවද, පාඨමාලා ආරම්භ කර වර්ෂයක් ඉකුත්ව තිබුණද, මෙම අරමුණු ඉටුකරගත හැකිවන ලෙස පාඨමාලා සංවර්ධනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ විද්‍යායතනයේ පාඨමාලා 07 ක් සඳහා බඳවා ගත් සිසුන් 156 න්, සිසුන් 47 දෙනෙක් පාඨමාලා හැර ගොස් තිබුණි. එක් එක් පාඨමාලව වෙන් වෙන්ව සැලකීමේදී පාඨමාලාව හැරයාමේ ප්‍රතිශතය සියයට 8 සිට සියයට 50 දක්වා වූ පරාසයක පැවතුණි. කෙසේ වුවද මෙම අනුපාතය අවම කර ගැනීම සඳහා ඊට හේතු වූ කරුණු හඳුනා ගෙන පිළියම් යෙදීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

4.2 කලමනාකරණ ක්‍රියාකාරකම්
-------------------------------------

විද්‍යායතනය පවත්වාගෙන යනු ලබන ඉඩම සහ ගොඩනැගිල්ල විද්‍යායතනය නමට පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය
------------------------------------------

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
-------------------------------------

2002 මැයි 24 දිනැති අංක පීඑෆ්/පීඊ-21 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන2016 ජූනි 06 දිනදී විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම
-----------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 වගන්තිය ප්‍රකාරව දිගුකාලීන දැක්මක් සහිතව පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වුවත් විද්‍යායතනය විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5.3 අභ්‍යන්තර විගණනය
------------------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කළ අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනය සඳහා වෙනම අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණු අතර අභ්‍යන්තර විගණන කාර්යයන්හි වගකීම වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය වෙත පවරා තිබුණි. අනුරාධපුර විද්‍යායතනය වෙනුවෙන් වෙනම අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර නොතිබුණු අතර අරමුණුගත කාර්යයන්හි කාර්යසාධනයක් ඇතිකර ගැනීම සඳහා අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මකව නොතිබුණි.

5.4 විගණන කමිටු

------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය අනුව විගණන කමිටු පිහිටුවා සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් පවත්වා නොතිබුණි.

5.5 අයවැය ලේඛනමය පාලනය

----------------------------------

2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 5(ඉ) වගන්තිය සහ 2014 අංක 01 දරණ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලියේ 16(2) (ඇ) සහ (ඉ) ඡේද ප්‍රකාරව වාර්ෂික අයවැය ලේඛනයක් සමඟ ව්‍යාපාරික සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

6. පද්ධති හා පාලන ක්ෂේත්‍ර

------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ගිණුම් පොත්පත් හා ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු නොකිරීම |
| (ආ) වත්කම් කළමනාකරණය | වත්කම් ගිණුම් තැබීම හා ලේඛන පවත්වා නොගැනීම සහ භාණ්ඩ සමීක්ෂණ සිදු නොකිරීම |
| (ඇ) මෙහෙයුම් පාලනය | පාඨමාලාවලට ඇතුළත් වන සිසුන් රඳවා තබාගැනීමට ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබීම. |